# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1714/1 - 2011 ජූලි 11 වැනි සඳුදා - 2011.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී 94/47 (III).

**(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2) (*ආ*) සහ 21(2) (*ආ*) වගන්ති යටතේ වූ නියමය

(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) (*ආ*) වගන්තිය සහ 21(2) (*ආ*) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය විමල් වීරවංශ වන මා විසින්, මේ නියමය මගින් –

(*අ*) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය "කිරිදිගල්ල ශ්‍රී විෂ්ණු දේවාල පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(*ආ*) කිරිදිගල්ල ශ්‍රී විෂ්ණු දේවාල පූජා භූමිය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් පරිබාහිර ක්‍රමයක් සකස් කළ යුතු බවටත් විධාන කරනු ලැබේ.

විමල් වීරවංශ,<br>
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,<br>
නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය.

2011 ජුනි මස 30 වැනි දින,<br>
කොළඹ,<br>
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

1A - G 14776— 380 (2011/07)

*සැ. යු.- අති විශෙෂ ගැසට් අංක 1713/1 කාණ්ඩය 1713/35න් අවසන් වේ.*

**උපලේඛනය**

***කිරිදිගල්ල ශ්‍රී විෂ්ණු දේවාල පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේයර් ජනරාල්ගේ 2010 පෙබරවාරි මස 03 වැනි දින අංක KU/IBB/2010/34 දරන සැලැස්මේ (FVP No. 1170) නිරූපිත වයඹ පළාතේ කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිදිගල්ල ග්‍රාම නිලධාරි වසමේ, පිහිටි හෙක්ටයාර් 2.4226 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 2 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 2, 27 සහ 26 ; |
| *දකුණට* | : | කැබලි අංක 30, 25, 24 සහ 2 ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 2 සහ 3. |

07-621

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.